සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA1 විභාගය - 2017 ජූලි

## (AA13) ව්‍යාපාර සහ ගිණුම්කරණය සඳහා ආර්ථික විද්‍යාව

(Economics for Business and Accounting)

2017-07-22
පස්වරු
[1.45 – 5.00]

පිටු ගණන : 06
ප්‍රශ්න ගණන: 06

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

අනිවාර්ය ප්‍රශ්න විස්ස (20) කි.

(මුළු ලකුණු 40)

### 01 වන ප්‍රශ්නය

*අංක* ***1.1*** *සිට* ***1.10*** *දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම සුදුසු උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාළ අංකය ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.1 පහත සඳහන් ඒවා අතුරෙන් "සූක්ෂම ආර්ථික විද්‍යාවේ" (Micro-economics) විෂය ක්ෂේත්‍රය වඩාත් හොඳින් පැහැදිලි කරන්නේ කුමන ප්‍රකාශයෙන්ද?

(1) එය ආර්ථිකය පිළිබඳ සමස්ථයක් වශයෙන් කටයුතු කරයි.

(2) එය තනි තීරණ ගන්නා ඒකකවල ආර්ථික හැසිරීම අධ්‍යයනය කරයි.

(3) එය පාරිභෝගිකයන්ගේ තීරණ පිළිබඳ පමණක් කටයුතු කරයි.

(4) එය වෙළෙඳපොළ ආර්ථික ක්‍රමය මුහුණදෙන ගැටළු සම්බන්ධයෙන් පමණක් කටයුතු කරයි.

**1.2** පහත සඳහන් ඒවා අතුරෙන් නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය සඳහා යොදාගන්නා උපකල්පනයක් **නොවන්නේ** කුමක් ද?


(1) සම්පත්වල පූර්ණ සේවා නියුක්තියක් තිබීම.

(2) භාණ්ඩ වර්ග දෙකක් පමණක් නිෂ්පාදනය කරනු ලබයි.

(3) සම්පත් අසීමිතව තිබීම.

(4) එය දෙනු ලබන නිශ්චිත කාලපරිච්ඡේදයක් සඳහා නිර්මාණය කරනු ලබයි.

**1.3** භාණ්ඩයක් සඳහා ඉල්ලුම් සහ සැපයුම් වක්‍ර පහත සඳහන් රූපසටහනෙන් පෙන්නුම් කරයි:




නිෂ්පාදන අතිරික්තය වන්නේ:

(1) රු.800/- (2) රු.1,200/- (3) රු.1,600/- (4) රු.400/-

**1.4** පුද්ගලයෙකු භාණ්ඩයක් පරිභෝජනය කිරීමෙන් ලබන තෘප්තිය හඳුන්වනු ලබන්නේ:

(1) ආන්තික උපයෝගිතාව ලෙසයි. (2) උපයෝගිතාවය ලෙසයි.

(3) ආවස්ථික පිරිවැය ලෙසයි. (4) මුළු උපයෝගිතාවය ලෙසයි.

**1.5** සාමාන්‍ය මුළු පිරිවැය [Average Total Cost (ATC)] වක්‍රයේ අවම ලක්ෂයේදී, ආන්තික පිරිවැය [Marginal Cost (MC)]:

(1) සාමාන්‍ය විචල්‍ය පිරිවැයට සමාන වේ. (2) සාමාන්‍ය මුළු පිරිවැයට සමාන වේ.

(3) සාමාන්‍ය ස්ථාවර පිරිවැයට සමාන වේ. (4) සාමාන්‍ය මුළු පිරිවැයට වඩා වැඩි වේ.

**1.6** නිදහස් වෙළෙඳපොළ ක්‍රමය තුළ රජය විසින් අවම මිල පැනවීම සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය පහත සඳහන් ඒවා අතුරෙන් තෝරන්න:

(1) එය පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමට රජය විසින් භාවිත කරනු ලැබේ.

(2) එය නිෂ්පාදකයින් ආරක්ෂා කිරීමට රජය විසින් භාවිත කරනු ලැබේ.

(3) එය ඉල්ලුම් ප්‍රමාණය වැඩි කිරීමට සහ සැපයුම් ප්‍රමාණය අඩු කිරීමට තුඩු දෙයි.

(4) ඉහත සඳහන් සියල්ලම වේ.

**1.7** කොළඹ පාරිභෝගික මිල දර්ශකය 2015 වර්ෂය සඳහා 132 ක් සහ 2016 වර්ෂය සඳහා 142 ක් වූයේ නම්, වර්ෂ දෙක අතර පැවති උද්ධමන අනුපාතිකය වන්නේ:

(1) 9.57% (2) 10.12% (3) 5.67% (4) 7.57%

**1.8** 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාවට අනුව, 2016 වර්ෂයේ ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන අනුපාතිකය වූයේ:

(1) 4.4% (2) 6.0% (3) 4.8% (4) 3.9%

**1.9** පහත සඳහන් ඒවා අතුරෙන්, ගෙවුම් ශේෂ ලේඛනයේ ජංගම (වර්තන) ගිණුමේ උප ගිණුමක් **නොවන්නේ** කුමක් ද?

(1) වෙළෙඳ ගිණුම. (2) ආදායම් ගිණුම.

(3) සේවා ගිණුම. (4) විදේශ ආයෝජන ගිණුම.

**1.10** නිදහස් වෙළෙඳපොළ ආර්ථික ක්‍රමයකට රජය මැදිහත් වීමට ප්‍රධාන හේතුවක් වන්නේ:

(1) රජයේ ආදායම වැඩි කිරීමටයි.

(2) විදේශ විනිමය ඉපැයුම් වැඩි කිරීමටයි.

(3) රටේ මුදල් සැපයුම වැඩි කිරීමටයි.

(4) ආදායමේ සහ ධනයේ සාධාරණ බෙදාහැරීමක් ලඟා කර ගැනීමටයි.

*අංක **1.11** සිට **1.15** දක්වා ප්‍රශ්නවල දී ඇති එක් එක් ප්‍රකාශය **සත්‍ය** හෝ **අසත්‍යදැයි** දක්වන්න. **සත්‍ය** හෝ **අසත්‍ය** යන උත්තරය ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.11** **A** භාණ්ඩයේ මිල අඩුවන විට, **B** භාණ්ඩය සඳහා ඉල්ලුම වැඩිවේ. **A** සහ **B** භාණ්ඩ ආදේශක භාණ්ඩ යැයි කියනු ලැබේ.

**1.12** කෙටිකාලයේදී සියලුම නිෂ්පාදන සාධක විචල්‍ය වේ.

**1.13** ඉල්ලුම සාපේක්ෂකව අනම්‍ය වනවිට, බදු බරෙන් වැඩි ප්‍රතිශතයක් පාරිභෝගිකයන් විසින් දරනු ලැබේ.

**1.14** දළ දේශීය නිෂ්පාදිතය [Gross Domestic Product (GDP)] ගණනය කිරීමේදී කළු කඩ ක්‍රියාවන් සහ නීති විරෝධී ක්‍රියාවන් ඇතුලත් කරනු ලබයි.

**1.15** මුදලේ දේශීය මූර්ත අගය යනු දේශීය වෙළෙඳපොළ තුළ මුදල් ඒකකයකින් මිලදී ගතහැකි භාණ්ඩ සහ සේවා ප්‍රමාණයයි.

*අංක **1.16** සිට **1.20** දක්වා ප්‍රශ්න වල හිස්තැන් පිරවීම සඳහා වරහන් තුල දී ඇති උත්තර දෙක අතුරින් නිවැරදි උත්තරය තෝරාගන්න. තෝරාගත් උත්තරය ප්‍රශ්න අංකය සමග, උත්තර පොතේ ලියන්න.*

**1.16** මුළු උපයෝගිතාවය උපරිම වන අවස්ථාවේදී, ආන්තික උපයෝගිතාවය ……………… *(සෘණ / ශුන්‍ය)* වේ.

**1.17** ආරක්ෂණ චේතනාව මත මුදල් සඳහා ඇති ඉල්ලුම ……………… *(සෘණාත්මකව / ධනාත්මකව)* මූර්ත ආදායමට සහ උද්ධමනයට සම්බන්ධ වේ.

**1.18** ණය හෝ අයිරා පහසුකම් මගින් මහජනයා වෙත මුදල් ණයට දීම ……………… *(මහ බැංකුවේ / වාණිජ බැංකුවල)* කාර්යයකි.

**1.19** අනාගත පරම්පරාවට තම අවශ්‍යතා සපුරා ගැනීමට ඇති හැකියාවට හානියක් නොවන ලෙස වර්තමාන පරපුර තම අවශ්‍යතා සපුරා ගනිමින් කෙරෙන සංවර්ධනය හඳුන්වනු ලබන්නේ ……………… *(ආර්ථික සංවර්ධනය / තිරසාර සංවර්ධනය)* ලෙසයි.

**1.20** සේවා වියුක්ති අනුපාතිකය යනු ……………… *(රැකියා නියුක්ත / රැකියා වියුක්ත)* ජනතාවගේ සංඛ්‍යාව ශ්‍රම බලකා සංඛ්‍යාවෙහි අනුපාතිකයක් ලෙස දැක්වීමයි. (එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 40)

*A කොටසෙහි අවසානය*

## B කොටස

අනිවාර්ය ප්‍රශ්න හතර (04) කි.

(මුළු ලකුණු 40)

### 02 වන ප්‍රශ්නය

(a) "ආර්ථික නොවන සම්පත්" යන පදය උදාහරණයක් සහිතව **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(b) භාණ්ඩයක් සඳහා පහත සඳහන් ඉල්ලුම් ලේඛනය ඔබ වෙත සපයා ඇත:

| **මිල (ඒකකයකට රු.)** | **ප්‍රමාණය (ඒකක)** |
|---|---|
| 10 | 20 |
| 9 | 25 |
| 8 | 30 |
| 7 | 35 |

භාණ්ඩයේ මිල රු.10/- සිට රු.9/- ට අඩු වූ විට, භාණ්ඩයේ මිල ඉල්ලුම් නම්‍යතාවය **ගණනය කරන්න.** (ලකුණු 03)

(c) පූර්ණ තරගය සහ ඒකාධිකාරය අතර වෙනස්කම් හතරක්(04) **සඳහන් කරන්න.** (ලකුණු 04)
(මුළු ලකුණු 10)

### 03 වන ප්‍රශ්නය

(a) "නිෂ්පාදන සාධක සඳහා ඇති ඉල්ලුම ව්‍යුත්පන්න ඉල්ලුමකි."

(i) ඉහත ප්‍රකාශය සමග ඔබ එකඟ වන්නේදැයි **සඳහන් කරන්න.** (ලකුණු 01)

(ii) ඔබේ උත්තරය සඳහා හේතු **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(b) පරිමාණානුකූල ඵල (returns to scale) වර්ග තුන(03) **පැහැදිලි කරන්න.** (ලකුණු 06)
(මුළු ලකුණු 10)

### 04 වන ප්‍රශ්නය

(a) (i) හොඳ මුදල් වල ලක්ෂණ හතරක්(04) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(ii) "මුදලට ඇති ඉල්ලුම" යනුවෙන් අදහස් කරනු ලබන්නේ කුමක්දැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(b) ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යයන් තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)
(මුළු ලකුණු 10)

### 05 වන ප්‍රශ්නය

(a) භාණ්ඩයක් සඳහා රජය විසින් සමතුලිත මිලට වඩා පහළින් උපරිම මිලක් පැනවීමේ ප්‍රතිවිපාක **පැහැදිලි කරන්න**.
(ලකුණු 06)

(b) අන්තර්ජාතික වෙළඳාම තුළ ආරක්ෂණවාදී ක්‍රියාමාර්ගවල (protectionism) වාසි හතරක්(04) **සඳහන් කරන්න**.
(ලකුණු 04)
(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

# C කොටස

අනිවාර්යය ප්‍රශ්නයකි.

(මුළු ලකුණු 20)

## 06 වන ප්‍රශ්නය

ආර්ථික ක්‍රමයක් යනු සමාජයක් තුළ මූලික ආර්ථික ප්‍රශ්න විසඳීමට ක්‍රියාත්මක කෙරෙන පද්ධතියකි. එක් එක් ක්‍රමයෙහි ලක්ෂණ පුළුල් මට්ටමේ වෙනස්කම් සහිතව විවිධ ආර්ථික ක්‍රම පරිචයේ පවතී.

**(A)** (a) ප්‍රධාන ආර්ථික ක්‍රම වර්ග තුනක්(03) **ලැයිස්තුගත කරන්න**. (ලකුණු 03)

(b) ඉහත (a) යටතේ ලැයිස්තුගත කරන ලද ආර්ථික ක්‍රම වලින් ඕනෑම එකක් මඟින් මූලික ආර්ථික ප්‍රශ්න විසඳනු ලබන්නේ කෙසේදැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

**(B)** ආර්ථිකයක ජාතික ගිණුම්වලට අදාලව 2016 වර්ෂය සඳහා සාධක පිරිවැය මිල යටතේ උපකල්පිත දත්ත පහත සඳහන් වගුවෙන් පෙන්නුම් කරයි:

| | **රු. මිලියන** |
|---|---|
| කෘෂිකර්මය, පශු සම්පත් සහ වන නිෂ්පාදන | 250 |
| ධීවර | 120 |
| පතල් සහ කැනීම් කටයුතු | 75 |
| නිමැවුම් කර්මාන්ත | 100 |
| විදුලිය, ගෑස් සහ ජලය | 200 |
| ඉදිකිරීම් | 80 |
| තොග සහ සිල්ලර වෙළඳාම | 150 |
| හෝටල් සහ අවන්හල් | 100 |
| ප්‍රවාහනය සහ සන්නිවේදනය | 160 |
| බැංකු, රක්ෂණ හා දේපළ වෙළඳාම් | 135 |
| නිවාස හිමිකම් | 200 |
| රාජ්‍ය සේවා | 160 |
| පෞද්ගලික සේවා | 250 |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2016 වර්ෂය සඳහා වක්‍රබදු සහ සහනාධාර පිළිවෙලින් රු. මිලියන 150 ක් සහ රු. මිලියන 100 ක් විය.

(2) පදනම් වර්ෂය 2010 වන අතර, 2016 වර්ෂය සඳහා මිල දර්ශකය 125 ක් විය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2016 වර්ෂය සඳහා, පහත සඳහන් දෑ **ගණනය කරන්න**:

(a) සාධක පිරිවැය මිලට දළ දේශීය නිෂ්පාදිතය [Gross Domestic Product (GDP)]. (ලකුණු 05)

(b) වෙළෙඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතය. (ලකුණු 03)

(c) මූර්ත දළ දේශීය නිෂ්පාදිතය [Real Gross Domestic Product (Real GDP)]. (ලකුණු 03)

(මුළු ලකුණු 20)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 01 මට්ටම<br>**අවබෝධය**<br><br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | **හඳුනා දක්වන්න** | යමක් මනා සැලකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | **සඳහන් කරන්න** | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම. |
| | **විමසන්න** | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | **පැහැදිලි කරන්න** | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | **අර්ථකතනය කරන්න** | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | **හඳුනාගන්න** | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | **සටහන් කරන්න** | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | **සාරාංශගත කරන්න** | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 02 මට්ටම<br>**භාවිතය**<br><br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | **ප්‍රදර්ශනය කරන්න** | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | **පිළියෙල කරන්න** | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | **ප්‍රමුඛතා දක්වන්න** | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | **සසඳන්න** | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 03 මට්ටම<br>**විශ්ලේෂණය**<br><br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | **සමානකම් බලන්න** | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම. |
| | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |